ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## <u>**පුවත්පත් නිවේදනය**</u>

## <u>**ඉන්දියානු නාවික හමුදාවේ ඛන්ජාර් නෞකාව ත්‍රිකුණාමලයේ සංචාරයක**</u>

දේශීයව නිපදවන ලද ඛුර්ක්‍රි පන්තියේ මිසයිල යුධ නෞකාවක් වන ඉන්දියානු නාවික හමුදාවේ “ඛන්ජාර්” නෞකාව 2023 ජූලි 29-31 දිනවල ත්‍රිකුණාමලයේ සංචාරයක නිරත විය.

2. ඉන්දියානු නාවික හමුදා නෞකාවේ අණදෙන නිලධාරී කොමාන්ඩර් එන්. වී. එස්. ෆානි කුමාර් මහතා නැගෙනහිර නාවික විධානය භාර අණදෙන නිලධාරිතුමා හමු විය. එසේම, VBSS, තුවක්කු සහ මිසයිල මෙහෙයුම් සම්බන්ධයෙන් විවිධ වෘත්තීය අන්තර් ක්‍රියාකාරකම් රැසක් ද පැවැත්විණ. හමුදාවේ සහ සිවිල් පරිපාලනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ප්‍රියසම්භාෂණයක් ද පැවැත්විණ. 2023 ජූලි 31 වන දින නෞකාව ශ්‍රී ලංකාවෙන් පිටත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ සමුද්‍රීය සහයෝගීතා අභ්‍යාසයක් ද ත්‍රිකුණාමලයට ඔබ්බෙන් පැවැත්විණ.

3. දෙරට ජනතාව අතර සබඳතා වර්ධනය කිරීම සහ ජනතාවට ඉන්දියානු නාවික හමුදාව සහ එහි හැකියාවන් පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා නෞකාව පාසල් සිසුන් සඳහා ද විවෘතව පැවතිණ. මෙයට අමතරව, 2023 ජූලි 30 වන දින ජනතාවට ද නෞකාව දැක බලා ගැනීමේ අවස්ථාව හිමි විය. නෞකා කාර්ය මණ්ඩලය විසින් යෝගා

සැසියක් ද වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් ද විශේෂ පාසලක් ද පවත්වන ලදී.

4. බුර්ක් පන්තියේ යුධ නෞකාවක් වන ඉන්දියානු නාවික හමුදාවේ ඛන්ජාර් නෞකාවේ ශ්‍රී ලංකා සංචාරය කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව සඳහා පවතින අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ හැකියාවන් සවිමත් කිරීමෙහි ලා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවයට පවතින විභවතාවය යන සන්දර්භය තුළ ද වැදගත්කමක් උසුළයි.

5. ජාත්‍යන්තර යෝගා දිනය සමරමින් ඉන්දියානු නාවික හමුදාවේ වාගීර් නෞකාව 2023 ජූනි 19-22 දිනවල කොළඹ සංචාරයක නිරත විය. ඉන්දියානු නාවික හමුදා යාත්‍රා විසින් සිදු කරන ශ්‍රී ලංකා සංචාර ඉන්දියාවේ සාගර් (කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය - SAGAR) යන දර්ශනය සහ “අසල්වැසියා ප්‍රථමයෙන්” යන ප්‍රතිපත්තිය අනුව අසල්වැසි රාජ්‍යයන් දෙකෙහි හමුදාවන් අතර සහෝදරත්වය සහ කාර්ය සහයෝගීත්වය වඩා ශක්තිමත් කරයි.

***

කොළඹ
2023 අගෝස්තු 01